ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/S/i/28/03/23

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.02.27 වන දින අරුණ පුවත්පතේ "රක්වාන ළමා නිවාසයක දැරියන් 11ක් අපයෝජනය කරලා" ලෙසින් පළවූ පුවතට අදාළව උක්ත ළමා නිවාසය සම්බන්ධයෙන් විශේෂ කරුණු සෙවීමේ මෙහෙවරක් සිදුකරන ලදී. එහිදී හඳුනාගත් කරුණු අනුව දෙමාපිය රැකවරණය අහිමි ආයතන ගත දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් 2023.03.27 වන දින කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

මෙම විශේෂ සාකච්ඡාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනී විනිසුරු රෝහිණී මාරසිංහ මැතිණියගේ මූලිකත්වයෙන් පැවති අතර ඒ සඳහා ජාතික පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් නාමල් ලියනගේ මහතා, සබරගමුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් රවීන්ද්‍රා මාලනී මහත්මිය, ළමා හා කාන්තා අපයෝජන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර මහත්මිය සහ ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ සහ ජාතික පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී විය.

මෙම සාකච්ඡාවේදී හඳුනාගත් කරුණු අනුව මූලික පියවර ලෙස සබරගමුව පළාත තුළ පිහිටා ඇති රාජ්‍ය සහ ස්වේච්ඡා ළමා නිවාස නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමටත්, එම ආයතනවල පවතින ගැටළු හා අවශ්‍යතා හඳුනාගැනීම සිදුකිරීමටත්, දැනට ජාතික පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ළමා ආරක්ෂක ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කමිටු යථාවත් කිරීමත් ඒ සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ දායකත්වය ලබාගැනීමටත් මාස 02 ක කාලයක් තුළ මෙහි ප්‍රගතිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තා කිරීමටත් නියම විය.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.03.28